# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 අප්‍රේල් මස 10 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2015. 04. 15 දින නිකුත් කරන ලදී)**

## ආගාමික හා විගාමික (සංශෝධන)

**(351 වන අධිකාරය වූ ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මහජන සාමය සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 3.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතට 35අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර නව වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම පවරන ලද අධිකාරියට ගමන් බලපත්‍ර අවශ්‍යතා සඳහා ඇඟිලි සලකුණු ලබා ගැනීමට විධිවිධාන සැලැස්වීම පිණිස හැකියාව ලබාදීම වේ.

# ආගාමික හා විගාමික (සංශෝධන)

එල්.ඩී.—ඕ. 25/2013

**(351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන ආගාමික හා විගාමික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

351 වන අධිකාරයට 35අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීම මගින් එකී පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"ගමන් බලපත්‍ර කාර්ය සඳහා ඇඟිලි සලකුණු ලබා ගැනීම.

35අ. ගමන් බලපත්‍ර නිකුත් කිරීම හෝ අලුත් කිරීම පවරන ලද අධිකාරිය විසින් ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා හෝ ගමන් බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලීමක් කරන යම් තැනැත්තකුගෙන් ගමන් බලපත්‍රයට ඇතුළත් කිරීම සඳහා, ඇඟිලි සලකුණු ලබාගත හැකිය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 008991 -450 (2015/04)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.